Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

**පාඩම:- මැටි භාණ්ඩ පිළිස්සීම හා පෝරණු වර්ග හඳුනා ගනී.**

11 ශ්‍රේණියේ පෙළ පොතේ පිටු අංක 116-127 දක්වා හොඳින් අධ්‍යයනයෙහි නිරත වීමෙන් පසු පහත සඳහන් අභ්‍යාසවල නිරතවන්න.

- නිර්මාණය කරුණු ලැබූ මැටි භාණ්ඩ කිසියම් කාල පරාසයක් තුළ අවශ්‍ය ප්‍රමාණයට තාපය ලබා දීම මගින් එම භාණ්ඩ පවතින භෞතික හා රසායනික වෙනසක් ඇති කිරීම පිළිස්සීම ලෙස හඳුන්වයි.

1. පහත සඳයන් ඡේදයේ හිස්තැනට සුදුසු නිවැරදි පිළිතුර ලියන්න.
   මැටි භාණ්ඩ පිළිස්සීමේදී මැටි භාණ්ඩ අන්තර්ගත ස්වභාවික_______හා_______සංයෝග වී ඇති ජලය_______මැටිවල ඇති_______අහෝසි වී ගොස් මැටි භාණ්ඩ_______තත්වයට පත්වේ.
2. මැටි භාණ්ඩ පිළිස්සීමේදී භාණ්ඩයේ සිදුවන වෙනස්කම් පහත දැක්වේ.
   - ශක්තිමත් වීම.
   - සැහැල්ලු බවට පත්වීම.
   - වර්ණය වෙනස් වීම.
   - ජලය රඳවා තබා ගැනීමේ හැකියාව.

   මේවා පැහැදිලි කරන්න.
3. උෂ්ණත්ව පරාසය අනුව නිෂ්පාදිත සෑම මැටි භාණ්ඩයක්ම මූලික පිළිස්සීම සිදු කළ යුතුය.මෙහිදී,
   I. භාණ්ඩ පිළිස්සීමේ උෂ්ණත්ව පරාසය කොපමණද?
   II. මෙම උෂ්ණත්ව පරාසය ඇත්තේ කුමන පෝරණු වර්ගයටද?
   III. මූලික පිළිස්සීමේ ක්‍රමයට පුළුස්සා ගන්නා මැටි භාණ්ඩ නම් කරන්න.
   IV. මෙම ක්‍රමයට පුළුස්සා ගන්නා මැටි භාණ්ඩ හඳුන්වන ආකාර කිහිපයක් ලියන්න.
4. ද්විතික පිළිස්සීම යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
5. මැටි භාණ්ඩ පිළිස්සීමේ ක්‍රියාවලිය තුල විවිධ වෙනස්කම් සිදු කෙරෙන අවස්ථා නම් කර ඒවා පැහැදිලි කරන්න.
6. නිෂ්පාදන ක්‍රියාවලිය අනුව භාණ්ඩයේ අඩංගු ජල ප්‍රමාණයන් ලියන්න.
7. මැටි භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයේ ස්වභාවික වියළන ක්‍රමයේ ඇති වාසි හා අවාසි මොනවාද?
8. භාණ්ඩ මත තාපය ලබා දෙන ආකාරය අනුව පහත කරුණුවලට අදාළ උදුන්වර්ගය නම් කරන්න.
   I. ගිනි ගඩොල්/උළු නිෂ්පාදනය සඳහා භාවිත කෙරෙන උදුන් වර්ගය
   II. නොවිරෙන ද්‍රව්‍යයන්ගෙන් සෑදූ කෙටි බිත්තියක් ආධාර කරගෙන ගිනි දැල්ල භාණ්ඩය මත වැදීම වැළැක්වීම සිදුකර ඇති උදුන් වර්ගය

III. මැටි භාණ්ඩ වල පිළිස්සීම නිසා ඇතිවන දෝෂ සම්පූර්ණයෙන්ම මගහරවා ගත හැකි උදුන වර්ගය

9. පහත සදහන් උදුන් වර්ග වල ඇති විශේෂ ලක්ෂණ වෙන් වෙන්ව පැහැදිලි කරන්න. (උඩු දගර පෝරණු/යටි දගර පෝරණු/පැති දගර පෝරණු)
10. මහා පරිමාණ කර්මාන්ත වල භාවිත කරන සන්තතික උදුන්වල ඇති වැදගත්කම පැහැදිලි කරන්න.
11. පහත දක්වා ඇත්තේ පෝරණුවක භාණ්ඩ ඇසිරීමට භාවිතා කරන උපකරණ කිහිපයකී.ඒවායින් ඇති ප්‍රයෝජන ලියන්න.
    - පෝරණු ලැලි හා පෝරණු කණු
    - සැගර් පින්ක්
    - රාක්ක
    - දිදාල
    - සැගර් පෙට්ටි
12. දේශීය පෝරණුවක ක්‍රියාකාරීත්වය පැහැදිලි කර එම පෝරණු සදහා යොදාගත හැකි ඉන්ධන වර්ග නම් කරන්න.